**ශීර්ෂය 276 - බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය, බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදි. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදි.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වේ. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 276 - බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනයන් සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල වීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශන පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූනි 05 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.10 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත

සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරි වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරිගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරි එම විධිවිධානයට අනුගතවී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
| --- | --- | --- | --- |
| **මුදල් රෙගුලාසිය** | | | |
| 128 (1) (අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසාදීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලසුම්කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබිය යුතු බවත්, | 1. අසම්පූර්ණ ලෙස ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම<br>2. ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන් ඉටු නොකිරීම.<br>3. ප්‍රසම්පාදන සැලැසුම් පිළියෙල නොකිරීම<br>4. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම | 2.2<br>2.3.1<br>2.4(අ)<br>2.7.1 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත්කරන බවත්, | 1. පොදු තැන්පතු සම්බන්ධයෙන් කටයුතු නොකිරීම<br>2. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම | 2.9(අ) හා (ආ)<br>2.10 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන | 1. රජය සතු වත්කම් කාර්යක්ෂමව භාවිතා නොකිරීම<br>2. වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම<br>3. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් | 2.5 (අ)<br>2.5(ආ)<br>2.5(ඇ) |

| | | | |
|---|---|---|---|
| | බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසි වලට හා උපදෙස් වලට අනුකූලව කරනු ලබන බවත්, | 4. විධිමත් පරිදි බාහිර පාර්ශවයන්ට වත්කම් පවරා නොතිබීම | 2.5(ඇ) |
| | | 5. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණවල නිර්දේශ ක්‍රියාත්මක නොකිරිම | 2.5(ඉ) |
| | | 6. වාහන අනතුරු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ අඩුපාඩු | 2.6 |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බවත්, | ප්‍රසම්පාදන සැලැසුම් විගණනයට ඉදිරිපත් නොකිරිම | 2.4(ආ) |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්යය පැවරී ඇති නිලධාරින් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බවත්, | රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම | 2.8 |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව , විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලකිලිලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බවත්, | 1. ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම් | 2.3.2. |
| | | 2. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | 2.3.3 |
| | | 3. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.3.4 |
| | | 4. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු | 2.4 |
| | | 5. වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ ඌනතා | 2.7 (අ) සිට (ද) දක්වා |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 2.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

-------------------------------------------------

(අ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ වූ අනුබද්ධ ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් ඇතිව කටයුතු කිරීම.

(ආ) රජයේ සියළු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණය පවත්වාගෙන යමින් පැවරෙන කටයුතු ඉටු කිරීම.

(ඇ) රජය හා පළාත් සභාව විසින් පවරා ඇති කටයුතු වෙනුවෙන් ආදායම් එකතු කිරීම.

(ඈ) දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධීකරණය, අධීක්ෂණය හා පරිපාලනය සම්බන්ධ කටයුතු පවත්වාගෙන යාම.

(ඉ) පළාත් සභාවට අදාළ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.

(ඊ) මැතිවරණ පැවැත්වීමට අදාළ සියළු කටයුතු සිදු කිරීම.

(උ) විමධ්‍යගත අයවැය වැඩසටහන ඇතුළුව රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් පවරන ප්‍රතිපාදන යටතේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම.

(ඌ) දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් ඇතුළු විවිධ විෂයයන් සඳහා සම්බන්ධීකරණ රැස්වීම් පැවැත්වීම හා ඊට අදාළ කටයුතු පවත්වාගෙන යාම.

(එ) දිස්ත්‍රික්කයේ සියළු රාජ්‍ය, ආගමික හා සංස්කෘතික ආදී උත්සව සංවිධානය කිරීම.

(ඒ) සිවිල් සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් ජනතාව හා රාජ්‍ය ආයතන කටයුතු අතර සම්බන්ධීකරණය සඳහා දායකවීම හා පොදු සමාජීය කාරණා නිරාකරණය සඳහා මැදිහත්ව කටයුතු කිරීම.

### 2.2 සැලැසුම් කිරීම

---------------

සමාලෝචිත වර්ෂය සඳහා බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි.

### 2.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

--------------------------------

#### 2.3.1 ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම

--------------------------------------------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රධාන කාර්යයන් 11 ක් ඉටු කළ යුතුව තිබුණත්, ඉන් කාර්යභාරයන් 9 ක් පමණක් ඉටු කර තිබුණි. හාලිඇල හා මහියංගනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පිළිවෙලින් රු.මිලියන 82 ක් සහ රු.මිලියන 20 ක් වශයෙන් එකතුව රු.මිලියන 102 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම කාර්යයන් සඳහා ශක්‍යතා අධ්‍යයනය නිම කිරීම හා ප්‍රසම්පාදනයන්ට අදාළ මූලික පියවර ක්‍රියාත්මක කිරීම පමණක් සිදු කර තිබුණි. යෝජිත කාල රාමුව තුළ කටයුතු නොකිරීම නිසා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 37.5 ක් පමණක් උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 64.5 ක් ඉතිරි කර තිබුණි.

#### 2.3.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

--------------------------------------------

දියතලාව ටාජ් සමුපකාර සමිති ගොඩනැගිල්ලේ වැසිකිළි පද්ධතිය සැකසීම සඳහා රු.199,370 ක් වටිනා ද්‍රව්‍ය ආධාර ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘතියට අයත් භූමිය වාණිජ කටයුත්තක් සඳහා බදු පදනම මත පෞද්ගලික පාර්ශවයක් විසින් ලබාගෙන තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. 2018 මාර්තු 22 දින වන විටත් එම ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

### 2.3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති 6 ක් වෙනුවෙන් රු.මිලියන 6.37 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ව්‍යාපෘති 04 ක් සඳහා අනුමැතිය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලබා දී නොතිබුණත්, එක් ව්‍යාපෘතියක් වර්ෂා කාලයේදී නායයාමේ අවදානමක් ඇති බව ප්‍රකාශ කිරීම හා තවත් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නැති බව සඳහන් කර එම ව්‍යාපෘති 6 සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ක්‍රියාත්මක නොකර අතහැර තිබුණි.

### 2.3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති 07 ක් ඉටු කිරීම සඳහා රු.මිලියන 2.72 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී සලසා තිබුණි. එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අමුද්‍රව්‍ය ලබා ගැනීමේ ප්‍රමාදයන් හා කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රමාදවීම් නිසා ව්‍යාපෘති නිම කිරීමට මාස 1 සිට මාස 4 ක් දක්වා පරාසයක කාල පමාවක් සිදු කර තිබුණි.

## 2.4 ප්‍රසම්පාදනයන්

### 2.4.1 ප්‍රසම්පාදනයන් සැලසුම් කිරීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ඉටු කර ගැනීම සඳහා රු. මිලියන 135.34 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 67.06 ක් උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනය සම්බන්ධයෙන් පිළියෙල කළ යුතු ප්‍රසම්පාදන සැලසුම් පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ පස්සර, කන්දකැටිය, බදුල්ල, වැලිමඩ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැසුමක් පිළියෙල කර නොතිබුණි.

(ආ) මහියංගණය ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ල ඉදිකිරීම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 220.90 ක්වූ පිරිවැය ඇස්තමේන්තුව 2016 වර්ෂයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබුණි. ව්‍යාපෘතියට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.4.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ ඇති ප්‍රා දේශීය ලේකම් කාර්යාල විසින් ඉටුකර තිබුණු ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහියංගණය ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා යෝග්‍ය භූමියක් නිශ්චිතව හඳුනාගෙන එම කටයුතු නිරවුල් කරගැනීමකින් තොරව, ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර පුවත්පත් දැන්වීම් මඟින් ලංසු කැඳවා කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම සඳහා කටයුතු කර තිබුණි.

(ආ) ඇල්ල, පස්සර, බදුල්ල හා වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එකතුව රු.මිලියන 4.79 ක ප්‍රසම්පාදන 78 ක් සම්බන්ධයෙන් අසම්පූර්ණ පිරිවිතර ඉදිරිපත් කර හා වගකීම් කාලය නිශ්චිතව සඳහන් නොකර ලංසු කැඳවා තිබුණි. මෙනිසා ලංසුකරුවන් විසින් තීරණය කර එවන ලද පිරිවිතර හා වගකීම් කාලය මත පදනම්ව ප්‍රසම්පාදන තීරණ ගෙන තිබුණි.

(ඇ) ඇල්ල සහ පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එකතුව රු.මිලියන 3.45 ක ප්‍රසම්පාදන 48 ක් සඳහා නිකුත්කළ ලංසු කැඳවීම්වල එකතු කළ අගය මත බදු වෙන් වෙන් වශයෙන් සඳහන් කළ යුතු බවට උපදෙස් ලබා නොදී ලංසු කැඳවීමේ ලේඛන නිකුත් කර තිබුණි.

(ඈ) පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලංසු කැඳවීමේ ලේඛනවල ඉදිරිපත් කරන ලද මිල ගණන් වලංගුව පවතින කාලය නිශ්චිතව සඳහන් කර නොතිබුණි. මේ නිසා කාර්යාලය විසින් රු.80,425 ක ප්‍රසම්පාදනයක් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කළ ලංසුවල සඳහන් මිල ගණන්මත භාණ්ඩ සැපයිය නොහැකි බව දන්වා භාණ්ඩ සැපයීම ප්‍රතික්ෂේප කර තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

### (අ) රජය සතු වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා නොකිරීම

කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් බොකන්ඔරුව, කන්දකැටිය හා තැටිල්ල ග්‍රාම නිලධාරි නිල නිවාස සියල්ලම පරිහරණයෙන් බැහැරව නිෂ්කාර්යව පැවතුණි.

### (ආ) වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

ඇල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පල්ලේපේරුව ග්‍රාම නිලධාරි වසමේ පර්චස් 20 ක භූමි ප්‍රමාණයක පිහිටි වර්ග අඩි 644 කින් යුක්ත පල්ලේපේරුව ග්‍රාම නිලධාරි නිවාසයේ 1999 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කිසිදු නිලධාරියෙකු පදිංචි වී නොතිබුණි. මේ හේතුවෙන් එම රජයේ නිවාසය හා භූමියෙහි වල් බිහිවී දිරාපත්වෙමින් පැවැතුණි. එම ඉඩමෙන් කොටසක් බාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් අත්පත් කරගෙන තිබුණු බවද නිරීක්ෂණය විය.

### (ඇ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| කාර්යාලය | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීයව පැවති කාලය |
|---|---|---|---|
| මීගහකිවුල | ඉඩම් (හෙක්ටයාර්) | 01 | වර්ෂ 01 |
| | ගොඩනැගිලි | | |
| | වාහන | 02 | වර්ෂ 09 |
| බණ්ඩාරවෙල | රෝනියෝ යන්ත්‍ර | 01 | වර්ෂ 02 |
| | රිසෝ යන්ත්‍ර | 01 | වර්ෂ 02 |

(ii) ඇල්ල නගරයේ ආරක්ෂාව තහවුරු කිරීමේ අරමුණින් සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියකින් රු. මිලියන 1.08 ක් වටිනා සී.සී.ටී.වී. කැමරා පද්ධතිය හා ඊට සම්බන්ධ අයිතම 29 ක් නඩත්තු කිරීමේ කටයුතු ඇල්ල පොලිස් ස්ථානය වෙත භාර දී තිබුණි. ඇල්ල පොලිස් ස්ථානය විසින් අදාළ පද්ධතිය හා උපාංග විධිමත් පරිදි භාරගත් බවට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර කැමරා 02 ක ඌනතාවයක් භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද ව්‍යාපෘතිය සැලසුම් කිරීමේදී ජාල පහසුකම් වෙනුවෙන් වූ බිල්පත් පියවනු ලබන ආකාරය තීරණය කිරීමකින් තොරව ව්‍යාපෘතිය ඉටු කිරීම හේතුවෙන් එම කැමරා පද්ධතිය අක්‍රීය තත්ත්වයේ පැවතුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

-----------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු ඉඩමක් හා ගොඩනැගිලි විදාතා සම්පත් මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම සඳහා 2009 මැයි 27 දින සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් භාර දී තිබුණි. එම ඉඩම් හා ගොඩනැගිලි විධිමත් පරිදි භාර දී නොතිබුණු බව නිරීක්ෂණය විය.

**(ඉ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

------------------------------

හාලි ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2016 වර්ෂය සඳහා සිදු කර තිබුණු භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව අළුත්වැඩියා කළ යුතුව තිබුණු වාහනේ පුටු 35 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අළුත්වැඩියා නොකර කාර්යාල පරිශ්‍රයේ අනාරක්ෂිව රඳවා තිබුණි.

## 2.6 පාඩු හා හානි

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 සැප්තැම්බර් 18 දිනැති අංක PF 437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ආයතනවල මෝටර් රථ ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් හෝ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් රක්ෂණය කරවා ගත යුතුව තිබුණි. ඇල්ල සහ පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් වාහන රක්ෂණ ආවරණ ලබා නොගෙන ධාවනය කර තිබුණි.

**(ආ)** 2010 අගෝස්තු 25 දින ධාවනයෙන් ඉවත් කර තිබුණු වාහනයක අනතුරකට අදාළ අලාභය තක්සේරු කර නොතිබුණු අතර ඒ සම්බන්ධ විස්තර හානි පිළිබඳ වාර්තාවේ සහ විසර්ජන ගිණුමේ ද ඇතුළත් කර නොතිබුණි.

**(ඇ)** දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහන වර්ෂ 7 ක සිට වර්ෂ 19 ක් දක්වා කාල පරාසයක් තුළ අවස්ථා 6 කදී අනතුරට ලක් වී එකතුව රු.මිලියන 8.04 ක අලාභහානි සිදු වී තිබුණි. ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාර පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. තවද මහියංගණය ප්‍රාදේශීය ලේකම් නිල නිවාසයේ ගෘහභාණ්ඩ හා උපකරණවලට හානි කිරීම සම්බන්ධයෙන් තක්සේරු කරන ලද රු.35,002 ක අලාභය, හානිය සිදුවී වසර 10 ක් ගතවී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.7 ප්‍රතිපාදන උපයෝජනය

---

### 2.7.1 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05ක කාලය තුළ බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 462.96 | 461.17 | 1.79 | 0.39 |
| | මූලධන | 69.85 | 56.10 | 13.75 | 19.69 |
| | **එකතුව** | **532.81** | **517.27** | **15.54** | **2.92** |
| 2014 | පුනරාවර්තන | 486.07 | 475.98 | 10.09 | 2.08 |
| | මූලධන | 257.75 | 128.10 | 129.65 | 50.30 |
| | **එකතුව** | **743.82** | **604.08** | **139.74** | **18.79** |
| 2015 | පුනරාවර්තන | 617.55 | 612.98 | 4.57 | 0.74 |
| | මූලධන | 118.00 | 97.77 | 20.23 | 17.14 |
| | **එකතුව** | **735.55** | **710.76** | **24.79** | **3.37** |
| 2016 | පුනරාවර්තන | 659.40 | 653.08 | 6.32 | 0.96 |
| | මූලධන | 125.00 | 61.39 | 63.61 | 50.89 |
| | **එකතුව** | **784.40** | **714.47** | **69.93** | **8.92** |
| 2017 | පුනරාවර්තන | 659.13 | 655.42 | 3.71 | 0.56 |
| | මූලධන | 150.00 | 81.04 | 68.96 | 45.97 |
| | **එකතුව** | **809.13** | **736.45** | **72.68** | **8.98** |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

---

2017 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් මූලධන වැය විෂයයක් සඳහා රු.මිලියන 13.45 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී ඉන් කිසිදු උපයෝජනයක් නොකිරීම නිසා එම මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

### 2.7.2 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

---

අමාත්‍යාංශ 26 ක් හා දෙපාර්තමේන්තු 20 ක් විසින් විවිධ කාර්යයන් සඳහා පිළිවෙලින් රු.මිලියන 2,756.37 ක් හා රු. මිලියන 186.54 වශයෙන් එකතුව රු.මිලියන 2942.91 ක් ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් එකතුව රු.මිලියන 2450.42 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදන වලින් රු.මිලියන 477.08 හෙවත් සියයට16.21ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ලබා දුන් ප්‍රතිපාදනවලින් හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දඹේතැන්න සායන මධ්‍යස්ථානය ඉදි කර තිබුණි. මෙම ඉදිකිරීම වෙනුවෙන් අවස්ථා 2 කදී අත්තිවාරම් බැදීම සහ අමතර කාර්ය වෙනුවෙන් එකතුව රු.429,505 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වියදම් කර ඉටු කළ එම කාර්යයෙන් කිසිදු ප්‍රයෝජනයක් ගෙන නොතිබුණි. එසේ නිෂ්කාර්ය වී තිබුණු වියදම ඊට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් ලබා දුන් ප්‍රතිපාදනවලින් හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතුව රු.976,105 ක ව්‍යාපෘති 02 ක් 2017 අගෝස්තු 17 දින ආරම්භ කර තිබුණි. කොන්ත්‍රාත්කරුවන් සමඟ එළඹ තිබුණු ගිවිසුම අනුව එම ව්‍යාපෘති 2017 සැප්තැම්බර් 06 දින නිම කළ යුතුව තිබුණි. 2017 දෙසැම්බර් 07 දින වන විටද එම ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. එම ව්‍යාපෘති ඉටු කිරීම භාරගත් කොන්ත්‍රාත්කරුවන්, කොන්ත්‍රාත් ගිවිසුම අනුව කටයුතු ඉටු නොකිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් ලබා දුන් ප්‍රතිපාදවලින් වැලිමඩ හා පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘතිවල හැඩයම් ගැසීම් කාර්යය සඳහා නියමිත රේටයට වඩා වැඩි රේටයක් භාවිතා කිරීම හේතුවෙන් එකතුව රු.63,904 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් ලබා දුන් ප්‍රතිපාදනවලින් සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තුරුපුර සිට පන්සල දක්වා මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා ද්‍රව්‍ය ප්‍රවාහනය කළ හැකි ප්‍රවේශ මාර්ගයක් තිබියදී, ව්‍යාපෘති භූමියට ඉදිකිරීම් ද්‍රව්‍ය කරමගින් ගෙන ඒමේ කාර්යය සඳහා එකතුව රු.19,668 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් ලබා දුන් ප්‍රතිපාදනවලින් සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිකිරීම් ව්‍යාපෘති 2 ක් ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘති සඳහා අවශ්‍ය වන හියුම් පයිප්ප ව්‍යාපෘති භූමියට කිලෝමීටර් 15 ක සිට 20 ක් දක්වා පරාසයක දුර ප්‍රමාණයකින් සපයා ගත හැකිව තිබුණත්, කිලෝමීටර් 73 ක දුරකින් ප්‍රවාහනය කළ බව සඳහන් කර එකතුව රු.5,999 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඊ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ලබා දුන් ප්‍රතිපාදන උපයෝගී කරගෙන පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිකිරීම් ව්‍යාපෘති 5 ක් ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘතිවල 1:2:4 (මි.මී. 19) මිශ්‍රණයෙන් මාර්ග කොන්ක්‍රීට් කිරීම සඳහා එකතු කළ අගය මත බදු රහිත මිල ගණන් භාවිතා කර ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. පසුව එකතු කළ අගය මත බදු ඇතුළත් කර ඇස්තමේන්තු සංශෝධනය කිරීමේදී මුල් ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රවාහන පිරිවැය වැඩියෙන් දක්වා තිබුණි. මේ නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති 5 වෙනුවෙන් එකතුව රු.63,147 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(උ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ලබා දුන් ප්‍රතිපාදන උපයෝගී කරගෙන කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘතිය යටතේ යන්ත්‍ර මගින් පස් කැපීමේ කාර්ය (E1-027) සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවීම් කර තිබුණි. නැවත එම මාර්ග කොටසේම කැළය එළිපෙහෙළි කිරීම වෙනුවෙන් (MS 1 – 022) රු.10,800 ක් ගෙවා තිබුණි. එම මාර්ග කොටසේ පස් කැපීමේ කාර්ය ඉටු කිරීමේදී කැළය එළිපෙහෙලි වී තිබුණත්, ඒ සඳහා රු.10,800 ක් ගෙවීම, වැඩිපුර ගෙවීමක් වශයෙන් නිරීක්ෂණය විය.

(ඖ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් ලබා දුන් ප්‍රතිපාදනවලින් හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් උස්සැල්ල සතිපොළ සංවර්ධනය කිරීම (මහලන්ද) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා මි.මි.10 වැර ගැන්නුම් සහිත වානේ කම්බි සහ මි.මි.06 මෘදු වානේ කම්බි යොදා ගනිමින් කුළුණු සහ තලාඳ යෙදීම් සිදුකර තිබුණි. ගොඩනැගිලි ඉදිකිරීම් අත්පොතේ වැරගැන්නුම් සහ මෘදු වානේ කම්බි සඳහා ගෙවීම් කිරීම සඳහා පිළිවෙලින් E-3 සහ E-1 වශයෙන් රේටයන් දෙකක් සඳහන් කර තිබුණි. E-3 රේටය පදනම් කර ගෙන කම්බි 479 kg ක් සඳහා ගෙවීම් කර තිබුණි. ව්‍යාපෘතිය සඳහා යොදනු ලැබූ කුළුණු සහ තලාඳ ඇතුළත් සැලැස්ම ප්‍රකාරව සියළු වැරගැන්නුම් කටයුතු සඳහා අවශ්‍ය වන කම්බි ප්‍රමාණය 411.93kg ක් වී තිබුණි. ඒ අනුව කම්බි 67.07 kg ක් සඳහා රු.18,713 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(එ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය ලබා දුන් ප්‍රතිපාදන උපයෝගී කරගෙන හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාර්ග කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘති 23 ක් ක්‍රියාත්මක කර තිබුණි. මාර්ග කොන්ක්‍රීට් කළ පසු ඒ සඳහා ජලය යෙදීමට අවශ්‍ය ජලය එම ව්‍යාපෘති ආසන්නයෙන් පහසුවෙන් ලබා ගත හැකිව තිබුණත්, ජලය යෙදීමේ කාර්ය වෙනුවෙන් එකතුව රු.83,621 ක් වැය කර තිබුණි.

(ඒ) නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝගී කර ගෙන හැලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘති 05 ක් 2015 වර්ෂයේදී ඉටු කර තිබුණි. කොන්ක්‍රීට් කරනු ලබන මාර්ගයේ දෙපස සුමට පෘෂ්ඨයක් අවශ්‍ය නොවන බැවින් මාර්ගය දෙපස හැඩයම් ලෑලි ගැසීම හා ගලවා ඉවත් කිරීමේ කාර්යය සඳහා අවම පිරිවැයක් සහිත SR -16 රේටය යොදා ගැනීම වෙනුවට SR -15 රේටය භාවිතා කිරීම නිසා එක් වර්ග මීටරයක් වෙනුවෙන් රු.60.30 බැගින් එකතුව රු.12,878 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඔ) නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන හාලි ඇල හා සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයවල පිහිටි පාසල් ආශ්‍රිත වකුගඩු රෝග නිවාරණ වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය, බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අතර මනා සම්බන්ධීකරණයක්, මඟපෙන්වීමක්, අධීක්ෂණයක් හා පසුවිපරමක් සිදු කර නොතිබුණු බැවින් සෞඛ්‍ය අමාත්‍යාංශය හා ජල සම්පාදන මණ්ඩලය අතර විධිමත් ලෙස අවශ්‍ය සහයෝගය ලැබී නොතිබුණි. මේ නිසා එම වැඩසටහන යටතේ වූ ව්‍යාපෘති අසාර්ථක වී තිබුණු අතර, ඒ සඳහා වැය කළ රු.මිලියන 9.46 ක වියදම නිෂ්කාර්ය වී තිබුණි.

(ඕ) නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය ලබා දුන් ප්‍රතිපාදන උපයෝගී කරගෙන වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම කොට්ඨාශය තුළ පාසල් ආශ්‍රිත වකුගඩු රෝග නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි. එම වැඩසටහන යටතේ පාසල් 09 ක ජල ටැංකි ඉදිකර ඒ සඳහා ජල ටැංකි මිලදී ගෙන තිබුණි. එම ජල ටැංකිවල වෙළෙඳ පොළ මිලට සියයට 10 ක් සහ සියයට 20 ක ලාභයක් ඇතුළත් කර ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. එම ලාභය ඇතුළත් ඇස්තමේන්තු වටිනාකම් මත ගෙවීම් කිරීම නිසා මිලදී ගෙන තිබුණු ජල ටැංකි සඳහා රු.65,400 ක අතිරේක වියදමක් කර තිබුණි.

(ක) නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයෙන් ලබා දුන් ප්‍රතිපාදන උපයෝගී කරගෙන කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පාසල් ආශ්‍රිත වකුගඩු රෝග නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි. කොට්ඨාශය තුළ පාසල් අතරින් තෝරාගත් පාසල් 14 ක් වෙනුවෙන් ජල පෙරණ උපකරණ 101 ක් සවිකිරීම සඳහා රු.මිලියන 2.69 ක ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. ඒ අනුව පාසල්/ආයතන 14 ක ජල පෙරණ උපකරණ 101 ක් සවිකර තිබුණි. ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී මිල ගණන් ලබා ගත් ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ග) නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයෙන් ලබා දුන් ප්‍රතිපාදනවලින් පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පරගහතැන්න ඇළ පැති බැම්ම සකස් කිරීමේ ව්‍යාපෘතිය ඉටු කර තිබුණි. පැති බැම්මට අදාළව 1:2:4 (මි.මී. 19) මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් කිරීමේ කාර්යය මිනිස් ශ්‍රමය මඟින් (STI-46) ඉටුකර ගැනීමටත්, ඉදිකිරීම් ද්‍රව්‍ය ගෙන ඒම කරමගින් සිදු කරන බව සඳහන් කර ඇස්තමේන්තු සකස් කර තිබුණි. ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවේශ මාර්ග පැවැතුනත් ද්‍රව්‍ය කර මතින් රැගෙන එන ලෙස ඇස්තමේන්තු පිළියෙල කර තිබුණු බව එක් කොටසක ඉදිකිරීමක් භෞතිකව පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය. මේ අනුව ද්‍රව්‍ය කර මතින් ගෙන ඒමේ කාර්ය වෙනුවෙන් රු.42,316 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඝ) නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය විසින් ලබා දුන් ප්‍රතිපාදන මත පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉටු කළ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා වාහන කුලියට ගැනීමේ පිරිවැයට සියයට 20 ක ලාභයක් ඇතුළත් කර ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. එම ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු ප්‍රකාරව ගෙවීම් කිරීමේදී එකතුව රු.71,760 ක් අදාළ කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩිපුර ගෙවා තිබුණි.

(ඡ) ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පාලුගම නගරයේ නිල සෙවණ ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘති ගිවිසුම් ප්‍රකාරව 2017 දෙසැම්බර් 30 දින ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට කොන්ත්‍රාත්කරු එකඟ වී තිබුණි. 2018 පෙබරවාරි 19 දින සිදු කරන ලද භෞතිකව පරීක්ෂාවේදී ව්‍යාපෘතිය නිම කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වී තිබුණු බව නිරීක්ෂණය විය. ගිවිසුම් ප්‍රකාරව එදින වන විට දින 51 ක කාලයක් ප්‍රමාද වී තිබුණත්, ඒ සඳහා රු.50,847 ක ප්‍රමාද ගාස්තු අයකර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙන නොතිබුණි.

(ජ) ආයුර්වේද දෙපාර්තමේන්තුව ලබා දුන් ප්‍රතිපාදන මත හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉටු කර තිබුණි ව්‍යාපෘති 4 ක් වෙනුවෙන් එකතුව රු.189,478 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඣ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලබා දුන් ප්‍රතිපාදන මත සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නාත්තරාව පාර ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය 457(මි.මී) ප්‍රමාණයේ හියුම් පයිප්ප සඳහා වැඩි පිරිවැයක් ඇතුළත් කර ගෙවීම් කිරීම නිසා රු.55,508 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ත) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 7.94 ක විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබුණි.

(ද) ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ ප්‍රතිපාදනවලින් වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් චක්‍රීය ණය සහ අපේක්ෂා ණය ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ සඳහා පවත්වා ගෙන යනු ලබන බැංකු ගිණුමේ 2018 පෙබරවාරි 14 දින වන විට රු.මිලියන 2.12 ක ශේෂයක් පැවැතුණි. 2017 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද ණය ඉල්ලුම් පත්‍ර 33 ක් සඳහා ණය මුදල් අනුමත කර නොතිබීම නිසා ඒ සඳහා ණය නිකුත් කිරීමට නොහැකි වී තිබුණි. මේ හේතුවෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂා කරන අරමුණු ඉටුකර ගැනීම සඳහා අදාළ මුදල් ඵලදායි ලෙස යොදවා ගැනීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.

**2.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 27601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණ සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 56.00 | 55.82 | 37.00 | 41.50 | 155.00 | 150.49 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

**හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.මිලියන 1.75.ක් වූ අතර, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**2.9 පොදු තැන්පත් ගිණුම්**

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන තැන්පත් ගිණුම් 06 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 211.54 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු.574,444 ක් වූ තැන්පතු 25 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.මිලියන 1.15කට අදාළ කාර්යය භාර්යයන් ඉටු නොකර එම මුදල් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**2.10 අනුකූල නොවීම**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| **(අ)** | **ඒකාබද්ධ සේවයේ නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්තිය** | | |
| | 2.2.2 හා 2.2.3 ඡේද | | සේවා ස්ථානයක වර්ෂ 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් අනිවාර්යයෙන්ම ස්ථාන මාරුවීම්වලට යටත් විය යුතුව තිබුණි. එම විධිවිධානවලට පටහැනිව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක නිලධාරීන් වර්ෂ 05 කට වැඩි කාලයක් සේවයේ නියුක්තව සිටින බව නිරීක්ෂණය විය. |
| **(ආ)** | **සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශයේ චක්‍රලේඛය** | | |
| | **(i)** 2016 ජනවාරි 12 දිනැති අංක 1/2016 දරන චක්‍රලේඛයේ 2.7 ඡේදය | | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් ප්‍රතිලාභීන්ගේ මිය යෑම සම්බන්ධව තොරතුරු විධිමත් පරිදි ලේඛනගත කර නොතිබුණි. මෙනිසා දීමනාලාභීන්ගේ මරණයෙන් පසුවද ඔවුන්ගේ නියෝජිතයන් විසින් දීමනා ලබා ගෙන තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. |
| | **(ii)** 2016 ජනවාරි 12 දිනැති අංක 1/2016 දරන චක්‍රලේඛයේ 2.14 ඡේදය | | දීමනාලාභියෙකු දීර්ඝ කාලීනව වැඩිහිටි දීමනාව ලබා නොගැනීම පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් විසින් විධිමත් පරිදි ලේඛනගත කර නොතිබුණි. මේ නිසා පොරොත්තු ලේඛනගතව සිටින දීමනා ලාභීන්ට ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. |
| **(ඇ)** | **විශ්‍රාම වැටුප් චක්‍රලේඛ** | | |
| | **(i)** 2003 සැප්තැම්බර් 25 දිනැති අංක 12/2003 දරන චක්‍රලේඛයේ 04 වන ඡේදය | 12,988,630 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් විසින් වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් නැවත අයකර ගැනීම සඳහා අදාළ විශ්‍රාමික නිලධාරීන්ගෙන් වැඩි වාරික ගණනක් තීරණය කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2007 මාර්තු 06 දිනැති 05/2007 චක්‍රලේඛය | 8,165,016 | විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් නැවත අය කර ගැනීමේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් විසින් වාරික තිරණය කළ හැකි මූල්‍යමය සීමාව ඉක්මවා වාරික ගණන තිරණය කර තිබුණි. |

## 2.11 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත හා තථ්‍ය කාර්ය මණ්ඩලය සහ පුද්ගල පඩිනඩි සඳහා වියදම**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 583.50 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.487,876 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **(i)** | ජ්‍යෙෂ්ඨ මට්ටම | 53 | 42 | 11 | -- |
| **(ii)** | තෘතියික මට්ටම | 32 | 23 | 9 | -- |
| **(iii)** | ද්විතියික මට්ටම | 1063 | 973 | 92 | 2 |
| **(iv)** | ප්‍රාථමික මට්ටම | 145 | 133 | 23 | 11 |
| | එකතුව | **1293** | **1171** | **135** | **13** |